## ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

### ස්ථාවර තැන්පතු ගිණුම

| නිමැවුමේ ස්වභාවය | ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ | ආරම්භක තැන්පතු හා ගාස්තු | සුදුසුකම | ප්‍රධාන නියම හා කොන්දේසි |
|---|---|---|---|---|
| ඉහළ ප්‍රතිලාභ ඉපැයීමට යම් නිශ්චිත කාලසීමාවක් සඳහා කරනුලබන තැන්පතුව | • **ආකර්ෂණීය පොලී අනුපාතයන්**<br><br>නවතම පොලී අනුපාත බලාගැනීමට https://www.boc.lk/rates-tariff#rupee-deposit-rates වෙත පිවිසෙන්න.<br><br>• මාසිකව හෝ කල්පිරෙන විට පොලිය ලබාගත හැකිවීම.<br><br>• ක්ෂණික ණය ලබාගැනීමේ පහසුකම<br><br>• පවත්නා කාලසීමාවන් : -<br>- මාස 1ක් සඳහා<br>- මාස 3ක් සඳහා<br>- මාස 6ක් සඳහා<br>- මාස 12ක් සඳහා<br>- අවුරුදු 2ක් සඳහා<br>- අවුරුදු 3ක් සඳහා<br>- අවුරුදු 4ක් සඳහා<br>- අවුරුදු 5ක් සඳහා | • **ආරම්භක තැන්පතුව** – අවමය රු.10,000/-<br><br>• **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු**<br><br>- බැංකු ප්‍රකාශ<br>- සහතිකයේ අනු පිටපත නිකුත්කිරීම<br>- ගිණුම් ශේෂයන් තහවුරු කිරීම<br><br>ගාස්තු දැනගැනීමට https://www.boc.lk/rates-tariff#general-tariff වෙත පිවිසෙන්න.<br><br>• **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ. | • වයස අවු. 18ට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් මෙම ගිණුම විවෘත කළහැකිය.<br><br>**ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර**<br><br>- ජාතික හැඳුනුම්පතේ (NIC)/ NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්;<br>- දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන;<br>- ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග,<br><br>• බැංකුවේ ස්ථාවර තැන්පතු විවෘතකිරීමේ අයදුම්පත් පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න. | • ස්ථාවර තැන්පතුවෙන් ණයක් ගැනීමේදී ගනුදෙනුකරු විසින් ස්ථාවර තැන්පතුව ඇපකරයක් ලෙස බැංකුවට පැවරිය යුතුය.<br><br>• තැන්පතු මුදල වැඩිකිරීමේදී ස්ථාවර තැන්පතු සහතිකයේ මුල් පිටපත බැංකුවට ඉදිරිපත් කළ යුතුය.<br><br>• සහතිකපත නැතිවූ විට ඒ බව වහාම බැංකුවට දැනුම්දිය යුතුය.<br><br>• කල්පිරීමට පෙරාතුව මුදල් ආපසුගැනීමේදී මාස 3කට වඩා වැඩි කාලයක් පවත්වාගෙන ගිය තැන්පතු සඳහා පොලිය ගෙවනු ලැබේ. සාමාන්‍ය ස්ථාවර තැන්පතුවට අදාළ පොලී අනුපාතයෙන් 4%ක් අඩුකර සම්පූර්ණ වූ මාස ගණන සඳහා පොලිය ගණනය කරනු ලැබේ. |

### රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

### ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.

**දුරකතන:** +94 11 220 4750 / +94 11 243 5814 **ෆැක්ස්**: +94 11 243 5815 **විද්‍යුත් ලිපිනය**: bocexmgt@boc.lk **වෙබ් අඩවිය:** https://www.boc.lk

**තැපැල:** ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අපගේ කුමන හෝ ශාඛාවක්, සේවා ඒකකයක්, හෝ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.

අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.

**Classification: Internal**

**Classification: Internal**